## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකළපුව

## ජාතික තරගකාරී ලංසුකරණය (සිවිල් වැඩ) ලංසු සඳහා ආරාධනයයි

01. මඩකළපුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දිස්ත්‍රික් ලේකම් වෙනුවෙන් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපතිවරයා විසින් පහත වගුවේ දක්වා ඇති මතුපිට කොන්ක්‍රීට් ඇතිරීමේ කටයුතු සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ.

02. මෙම ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය(NCB) මගින් මෙහෙයවේ.

03. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට නම්, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනයට ඇතුළත් නොවූවකු විය යුතු අතර, ශ්‍රී ලංකාවේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය. තවද, රුපියල් මිලියන 5.0 ඉක්මවන කොන්ත්‍රාත්තු වටිනාකම සඳහා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව ලංසුකරුවන් ශ්‍රී ලංකා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. PCA-03 සහතිකය හෝ අදාළ සාක්ෂි ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

04. සුදුසුකම් ලැබීමේ අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල 4 වන කොටසේ දක්වා ඇත. අතිරේක තොරතුරු ප්‍රසම්පාදන ලේඛනවල 5 වන කොටසේ දක්වා ඇත.

05. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව** (දුරකථන අංකය : 0652222154, ෆැක්ස් : 0652224466) වෙතින් ලබාගත හැකි අතර, ඕනෑම වැඩ කරන දිනයක 09.00 පැය සිට 16.00 පැය දක්වා ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැකිය.

06. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක්, උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් දිස්ත්‍රික් ලේකම් මඩකළපුව ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් වෙතින් 2026.10.16 සිට 2026.10.28 දක්වා ඕනෑම වැඩ කරන දිනයක 09.00 පැය සිට 15.00 පැය දක්වා, වගුවේ දක්වා ඇති එක් කට්ටලයක් සඳහා වන ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලබාගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.

07. ලංසු ලියාපදිංචි තැපෑලෙන් 2026.10.29 දින ප.ව. 02.00 පැයට හෝ ඊට පෙර **සභාපති, දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව** වෙත එවිය යුතුය. නැතහොත් මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 1 වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ප්‍රමාදව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ සිදු කෙරේ.

08. සියලුම ලංසු සමග පහත වගුවේ දක්වා ඇති තොරතුරු අනුව බැංකු ඇපකරයක් / ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල ඇපකරයක් හෝ ආපසු ගෙවන මුදල් තැන්පතුවක් ලෙස සුදුසු ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. මුදල් තැන්පතුවක් කරන්නේ නම්, ලංසුකරු විසින් මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් තැන්පත් කළ යුතු අතර, මුල් මුදල් ලදුපත ලංසුව සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

09. ලංසු **"මුල් පිටපත"** සහ **"අනු පිටපත"** ලෙස ඉදිරිපත් කළ යුතුය. මුල් අනුපිටපත සහ අනු පිටපත වෙන වෙනම මුද්‍රා තැබූ කවරවල බහා පිළිවෙළින් **"මුල් පිටපත"** සහ **"අනුපිටපත"** ලෙස සලකුණු කළ යුතුය. කවර දෙකම තනි මුද්‍රා තැබූ කවරයක බහා, එහි ඉහළ වම් කෙළවරේ කාර්යයේ විස්තරය සහ ලංසු අංකය සඳහන් කළ යුතුය.

10. පූර්ව ලංසු රැස්වීම 2026.10.21 දින ප.ව. 03.00 මඩකළපුව, තිරායිමඩු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වේ. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඔවුන්ගේ වියදමින් පූර්ව ලංසු රැස්වීමට සහභාගි විය හැක.

11. කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර ඕනෑම අවස්ථාවක මෙම ප්‍රසම්පාදනය අවලංගු කිරීමට හෝ ඉල්ලා අස්කර ගැනීමට අයිතිය සේවායෝජකයා සතු වේ.

| ව්‍යාපෘතියේ නාමය සහ ලංසු අංකය | පිරිවැය (රු.) (බදු රහිත) | දරන පොදු කොන්ත්‍රාත් පසතේ අවශ්‍යතාවය | ලංසු වලංගු කාලය එක් දින | ලංසු සුරක්ෂණ මුදල (රු.) | සුරක්ෂණයේ වලංගු කාල දිනය | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | කොන්ත්‍රාත් කාලය | CIDA ශ්‍රේණිය / විශේෂත්වය | අරමුදල් ප්‍රභවය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඒරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාවිලෛයියාරු මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CSMEP/2/2026/541 | 11,251,942.34 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 113,000.00 | 2027.02.11 දක්වා | 4,000.00 | දින 30 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| ඒරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලවයි මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CTHRE/2/2026/542 | 12,630,569.84 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 127,000.00 | 2027.02.11 දක්වා | 4,000.00 | දින 30 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| කෝරළේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වට්ටවාන් මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CVRKN/2/2026/543 | 17,825,172.68 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 179,000.00 | 2027.02.11 දක්වා | 5,000.00 | දින 45 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| කෝරළේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කායන්කර්නි මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CKAKN/2/2026/544 | 18,850,172.68 | අවශ්‍ය වේ | 2027.01.28 දක්වා | 189,000.00 | 2025.02.25 දක්වා | 5,000.00 | දින 45 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| කෝරළේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේපන්වෝලෛයි මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් කිරීම. PMD/CVEKP/2/2026/545 | 21,736,820.80 | අවශ්‍ය වේ | 2027.01.28 දක්වා | 218,000.00 | 2025.02.25 දක්වා | 6,000.00 | දින 45 | C6, C5 සහ C4 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| කෝරළේපත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිහිලිවෙට්ටායි මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CTKPS/2/2026/546 | 20,473,162.80 | අවශ්‍ය වේ | 2027.01.28 දක්වා | 205,000.00 | 2025.02.25 දක්වා | 6,000.00 | දින 45 | C6, C5 සහ C4 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කුරුක්කල්මඩම් මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CKRMS/2/2026/547 | 5,945,057.56 | අවශ්‍ය වේ | 2027.01.28 දක්වා | 60,000.00 | 2027.02.11 දක්වා | 2,500.00 | දින 30 | C8, C7 සහ C6 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| මන්මුනෙයි තිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වල්කාඩු මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CVMSW/2/2026/548 | 11,331,942.34 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 114,000.00 | 2027.02.11 දක්වා | 4,000.00 | දින 30 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි මහිලාවෙට්ටුවාන් මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CMRMW/2/2026/549 | 11,557,984.46 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 116,000.00 | 2027.02.11 දක්වා | 4,000.00 | දින 30 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි නාවල්තෝට්ටම් මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CNTMW/2/2026/550 | 15,923,740.00 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 160,000.00 | 2027.02.11 දක්වා | 5,000.00 | දින 30 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| පෝරතිවු පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි විවේකානන්දපුරම් මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CVPPP/2/2026/551 | 30,358,981.20 | අවශ්‍ය වේ | 2027.01.28 දක්වා | 304,000.00 | 2027.02.25 දක්වා | 7,500.00 | දින 45 | C6, C5 සහ C4 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |
| මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි සත්තුරුකොන්ඩාන් මාර්ගයෙහි මතුපිට කොන්ක්‍රීට් ඇතිරීම. PMD/CSZMN/2/2026/552 | 16,925,740.60 | අවශ්‍ය වේ | 2027.01.14 දක්වා | 170,000.00 | 2027.02.11 දක්වා | 5,000.00 | දින 30 | C7, C6 සහ C5 මාර්ග/ මහා මාර්ග | ශ්‍රී ලංකා රජය |

**සභාපති,**
**දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම්,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, තිරායිමඩු, මඩකළපුව.**
**2026.10.16**